## 27



# ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා

මෙලොව පහළ වූ නබිවරුන් අතරින් නබි ඉබ්රාහීම් අලයිහිස්සලාම් තුමා වැදගත් කෙනෙකි. එතුමාගේ පුත් ඉස්මායීල් අලෛහිස්සලාම් තුමා ද ඔහුගේ පරම්පරාවෙන් පැමිණි මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා ද ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ තවත් පුතෙකු වූ ඉස්හාක් අලෛහිස්සලාම් තුමා ද ඔහුගේ පුත් යඃකූබ් අලෛහිස්සලාම් තුමා ද ඔහුගේ පුත් යූසුෆ් අලෛහිස්සලාම් තුමා ද නබිවරුන් වශයෙන් සිටියහ. එහෙයින් එතුමාට **"අබුල් අන්බියා" (නබිවරුන්ගේ පියා)** යනුවෙන් හඳුන්වනු ලබයි.

මෙතුමා ක්‍රි.පූ. 21 වන සියවසේ ඉරාකයේ එවකට අගනුවර වූ "උර්" නම් ග්‍රාමයේ "ආසර්" නැමැත්තාට දාව උපන් පුතෙක් වේ. ආසර්, ප්‍රතිමා නිර්මාණයෙහි ද ප්‍රතිමා වන්දනාවෙහි ද නියැලුණේ ය.

බාලවියේ දී ම බුද්ධිමත් වූ ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා පියාගේ හා පොදු ජනයාගේ නැමදුම් වතාවත් වැරැදි බව ගෙනහැර දැක්වූවේ ය. එහෙත් එතුමාගේ පියා ද රාජ්‍ය පාලකයා ද පොදු ජනයා ද එතුමා නොපිළිගත්හ. තමන්ගේ වතාවත් ප්‍රතික්ෂේප කළ බැවින් ගිනි ජාලයක් සූදානම් කර එහි දමා ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා පුලුස්සා දැමීමට තීරණය කළහ. එනමුත් එම ගිනි ජාලය අල්ලාහ්ගේ විධානයට අනුව ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාට ශාන්තිය හා සිසිලස ලබා දී එතුමාගේ ශරීරයත් ප්‍රාණයත් ආරක්ෂා කළේ ය.


ඉන් ආරක්ෂා කරන ලද ඉබ්රාහීම් නබි තුමා බිරිඳ සාරා තුමිය සමඟ ඉරාකයේ සිට ඊජිප්තුවට හිජ්රත් කළේ ය. මෙම හිජ්රතයේ දී ඉබ්රාහීම් අලෛහිස්සලාම්තුමා තමන්ට පරපුරක් දයාද කර දෙන මෙන් ප්‍රාර්ථනා කළේ ය.

ඊජිප්තුවට ගිය ඉබ්රාහීම් අලයිහිස්සලාම් තුමා හාජරා යන කාන්තාව විවාහ කර ගත්තේ ය. එනමුත් මහලු වියට පත් වන තෙක් ම දරුවෙකු ලැබීමේ භාග්‍යය ඔවුන්ට නොලැබුණි.

බලාපොරොත්තු නොවූ ලෙස හාජරාට "ඉස්මායීල් " නම් දරුවා ද සාරාට "ඉස්හාක් " නම් දරුවා ද ලැබුණි. එතුමා ඊජිප්තුවේ සිටින විට මක්කාවට යන ලෙසත් එහි හාජරා හා ඉස්මායීල් දරුවා අතහැර දමා එන ලෙසත් අල්ලාහ් එතුමාට අණ කළේ ය. මේ අනුව ඊජිප්තුවෙන් පිට වී මිනිස් වාසයෙන් තොර එම කාන්තාරයේ (මක්කාවේ) මවත් දරුවාත් අතහැර ඔවුන්ගේ යහපත උදෙසා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරමින් මක්කාවෙන් පිට වුණේ ය.

මක්කාවේ දරුවා සමඟ අතහරින ලද හාජරා තුමිය තමන් රැගෙන ගිය ආහාර පාන අවසන් වූ පසු දරුවා කුසගින්නේ හඬා වැලපෙන විට ජලය සොයා දස අත දිව ගියා ය. එවිට සෆා පර්වතය සිට මර්වා පර්වතය දෙසටත් මර්වා සිට සෆා දෙසටත් මාරුවෙන් මාරුවට දිව ගිය ද එහි මිනිසකු හෝ දිය පොදක් හෝ නොදුටුවා ය. එම අවස්ථාවේ දී ජිබ්රීල් අලෛහිස්සලාම් තුමා එතනට පැමිණ, දරුවාගේ පාමුල 'සම් සම්' නම් දිය උල්පත මතු කළේ ය. දරුවා දෙසට පැමිණි හාජරා දිය උල්පත දැක සතුටට පත් වූවා ය. උල්පත වටා බැම්මක් හැදුවා ය. ජලය දෑතින් ගෙන තමා ද පානය කර දරුවාට ද පෙව්වා ය. මක්කාවට ව්‍යාපාරික චාරිකාවක නියැලුණු ජුර්හම් ගෝත්‍රිකයෝ දිය සොයා ඇවිද්දෝ ය. කුරුල්ලන් රවා මවමින් ගැවසෙන ස්ථානයක් නිරීක්ෂණය කර සම් සම් දිය උල්පතට සමීප වූහ. දිය උල්පත දුටු විට ඉන් දිය ගැනීමට අවසර පැතුවෝ ය. හාජරා අවසර දුන්නා ය. මේ නිසා එම ස්ථානයේ ජනාවාස බිහිවීම ආරම්භ විය. ඉස්මායීල් අලෛහිස්සලාම් තුමා ජුර්හම් ගෝත්‍රිකයන්ගෙන් අරාබි භාෂාව ඉගෙන ගත්තේ ය.

මෙලෙස ජීවිකාව ගත කරමින් සිටිය දී ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා තම පුතණුවන් 'කුර්බාන්' කරන අයුරු සිහිනෙන් දුටුවේ ය. ඉන් පසු එතුමා මක්කාවට පැමිණ පුතණුවන් මිනාව දෙසට කැඳවාගෙන ගොස් තමන් දුටු සිහිනය පිළිබඳව දැනුම්වත් කර ඒ පිළිබඳ පුතණුවන්ගේ අදහස විමසුවේ ය. එවිට පුත් ඉස්මායීල් තුමා "පියාණනි!, ඔබට ලැබුණු අණ අනුව ඔබ ක්‍රියා කරන්න" යැයි පැවසුවේ ය. පුතණුවන් කුර්බාන් කිරීමට සූදානම් වූවේය. අල්ලාහ් එය ප්‍රිය නොකළේ ය. ඉස්මායීල් අලෛහිස්සලාම් තුමා ආරක්ෂා කරන ලදී. එහෙයින් ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා **"කලීලුල්ලාහ්"** (අල්ලාහ්ගේ මිතුරා) ලෙසත් ඉස්මායීල් අලෛහිස්සලාම් තුමා **සබීහුල්ලාහ් ලෙසත්** හඳුන්වනු ලබයි.


කෘබාව සහ මකාමු ඉබ්රාහීම්

ඉන් වසර කිහිපයකට පසු ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා තම පුතණුවන් සමඟ එක්ව කෘබතුල්ලාහ්ව ඉදිකිරීමේ සේවයෙහි නියැලුණහ. කෘබාවේ බිත්තිවල උඩ කොටස ඉදි කරන විට ගලක් උඩ නැග එය සාද නිම කළේ ය. එම ගලෙහි ඉබ්රාහීම් අලෛ0හිස්සලාම් තුමාගේ දෙපා සලකුණු තැන්පත් වී ඇත. එම ගල **"මකාමු ඉබ්රාහීම්"** යයි හඳුන්වනු ලැබේ. ඉන්පසු හජ් කාර්යය ඉටු කිරීම උදෙසා ජනතාව කැඳවන ලෙස අල්ලාහ් අණ කළේ ය. හජ් වගකීම තුළින් ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා හා එතුමාගේ පවුලේ උදවියගේ පරිත්‍යාගය සිහිගන්වනු ලබයි.

ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ ප්‍රාර්ථනාවට අනුව මක්කාව, පූජනීය ස්ථානයක් බවට පත් විය. සම් සම් ජලය සම්පතක් බවට පත් විය. හජ් වගකීම එහි ඉටු කෙරේ. එය ජනාකීර්ණ විය. එතුමාගේ පරම්පරාවේ මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඉපදුණහ.

"ඉබ්රාහීම් තුමා ළඟ හා ඔහු සමඟ සිටියවුන් ළඟ රමණීය ආදර්ශ තිබිණි" (60:4)

මෙලෙස අල්ලාහ් ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා බොහෝ සේ ප්‍රශංසා කර ඇත. එහෙයින් අපි ද අපගේ ජීවිතය තුළ ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ ආදර්ශ පිළිපදිමින් ජීවත් වෙමු.

පාඩමෙහි අන්තර්ගත අරාබි වචන

أَبُو الْأَنْبِيَاء    زَمْ زَمْ    أَبٌ رَحِيْمٌ    جُرْهُم

**අභ්‍යාස**

(අ) කෙටි පිළිතුරු සපයන්න.

1. ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ විශේෂිත නාමය සඳහන් කරන්න.
2. එතුමා උපන් රට හා ග්‍රාමය කුමක් ද?
3. එතුමාගේ පියාගේ නම හා රැකියාව කුමක් ද?
4. එතුමාගේ කාලයේ දී දක්නට ලැබුණු නැමදුම් වතාවත් මොනවා ද?
5. එතුමා ජීවත් වූ රටවල් තුනක් සඳහන් කරන්න.
6. එතුමාගේ බිරින්දෑවරුන්ගේ හා දරුවන්ගේ නම් ලියන්න.
7. මකාමු ඉබ්රාහීම් යනුවෙන් කුමක් හඳුන්වනු ලබයි ද?

(ආ) පිළිතුරු ලියන්න.

1. ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා "නබිවරුන්ගේ පියා" ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද?
2. "සම් සම්" දිය උල්පත හටගත් ආකාරය කෙටියෙන් ලියන්න.
3. ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ පවුල හා සබැඳි හජ් හි ක්‍රියාකාරකම් ලයිස්තු ගත කරන්න.
4. ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා තුළ දක්නට ලැබුණු මහත්මා ගුණාංග ගෙන හැර දක්වන්න.